# පළමුවැනි පරිශිෂ්ටය

( අ ) ලංකා පාර්ලිමේන්තුව විසින් 1964 දී පනවන ලද, ප්‍රධාන නීති වලින් උපුටා ගත් මහ බැංකුවේ සහ බැංකු සංස්ථාවල කටයුතු හා ගනු දෙනු වලට අදාළ, කොටස්.

(ආ) 1964 දී මුදල් මණ්ඩලය විසින් සකස් කර ගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන.

## අ – ලංකා පාර්ලිමේන්තුව විසින් 1964 දී පනවන ලද, ප්‍රධාන නීති වලින් උපුටාගත්, මහ බැංකුවේ සහ බැංකු ආයතනවල කටයුතු හා ගනුදෙනු වලට අදාල කොටස්.

### (i) 1964 අංක 23 දරන විසර්ජන පනත

1964 – 65 මුදල් වර්ෂයේ සේවා සඳහා ද, එවැනි සේවා සඳහා ලංකාව තුළින් හෝ පිටතින් හෝ ණය ලබා ගැනීමට බලය පැවරීම සඳහා ද, එම මුදල් වර්ෂය තුළ රජයේ සමහර කටයුතු සම්බන්ධයෙන්, මුදල් වෙන්කිරීම සඳහා ද, එම මුදල් වර්ෂය තුළ එවැනි කටයුතු සඳහා වියදම් කිරීම සඳහා ද, ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජය විසින් සුදුස්සක් කළහැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ද, එම මුදල් එකී ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවීමට ඉඩ සැලසීමට ද, ඉහත කී කටයුතු වලට සම්බන්ධිතව හෝ ආනුෂංගිකව හෝ ඇති කරුණු සඳහා ඉඩ සැලසීමට ද, බලය පැවරෙන පනතෙකි.

1. මේ පනත 1964 අංක. 23 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (i) කුමන හෝ වියදමක් සඳහා බලය පැවරෙන වෙනත් අනෙක් නීතියකට හානියක් නොවන පරිද්දෙන් 1964 ඔක්තෝබර් 1 වැනිදසින් පටන්ගෙන, 1965 සැප්තැම්බර් 30 වැනිදසින් අවසන් වන, මුදල් වර්ෂයේ සේවාවන් සඳහා තක්සේරු කරන ලද රජයේ වියදම වන රුපියල් දෙසිය විසි කෝටි හැත්තෑ හතර ලක්ෂ තිස් හතර දහස් අටසිය පනස් හය.

(අ) මෙයින් බලය පැවරෙන ගෙවීම්, ලංකාවේ ඒකාබධ අරමුදලින් හෝ රජයේ හෝ රජය විසින් සුදුස්සක් කළ හැකි වෙනත් අනෙක් අරමුදලකින් හෝ මුදල් වලින් ද,

සහ

(ආ) ලංකාණ්ඩුව වෙනුවෙන් හෝ සඳහා හෝ ලංකාව තුළින් හෝ පිටතින් හෝ මුළු වශයෙන් රුපියල් කෝටි 66 කට නොවැඩිව ලබා ගැනීමට මෙයින් බලය පැවරෙන ණය වලින් ද, ලබාගත යුතුය.

මෙහි මින් පෙර, සඳහන් රුපියල් දෙසිය විසිකෝටි හැත්තෑ හතර ලක්ෂ තිස් හතර දහස් අටසිය පනස් හය මේ පනතෙහි පළමුවැනි උප ලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

(2) මේ වගන්තියේ (1) වැනි උප වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ දී, රජය සඳහා හෝ වෙනුවෙන් හෝ ණය ගැනීම සඳහා බලය පැවරෙන වෙනත් කුමන හෝ ලිඛිත නීතියක විධිවිධාන වලට හානියක් නොවිය යුතුය.

3. (1) මේ පනතේ දෙවැනි උප ලේඛනයේ I වැනි තීරුවෙහි නියමිත, එක් එක් කාර්යයන් සඳහා 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ රජයේ ලැබීම්, ඒ ඒ කාර්යයන් සඳහා වෙන් වූ ගිණුමට බැර කළ යුතුයි. එහෙත්, එසේ බැර කරනු ලැබීම්, එම උප ලේඛනයෙහි III වැනි තීරුවෙහි අනුරූප සටහනේ, නියමිත උපරිම සීමාව, නො ඉක්මවිය යුතුය. එවැනි උපරිම සීමාව ඉක්මවා එවැනි කාර්යයන්ගෙන් ලැබෙන ලැබීම්, ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

(2) මෙහි 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ, මේ පනතෙහි 2 වැනි උප ලේඛනයේ I වැනි තීරුවෙහි නියමිත, එක් එක් කාර්යය උඩ රජය විසින් කැරුන වියදම් එම මුදල් වර්ෂය තුළ එවැනි

කාර්යයන්ගෙන් රජයට ලැබෙන ලැබීම් වලින් ගෙවිය යුතුය. එහෙත්, එවැනි වියදම් එම උප ලේඛනයේ II වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නො ඉක්මවිය යුතුයි.

(3) 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය අවසානයේ, මේ පනතේ දෙවැනි උප ලේඛනයේ I වැනි තීරුවෙහි නියමිත කුමන කාර්යයක් හෝ සම්බන්ධයෙන් ඉතිරිව ඇති හර ශේෂය, උප ලේඛනයේ IV වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නො ඉක්මවිය යුතුය. එසේම, එම මුදල් වර්ෂය අවසානයේ දී එකී කටයුත්ත සඳහා වූ මුළු වගකීම, එම උප ලේඛනයේ, V වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නො ඉක්මවිය යුතුය.

(4) 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ, ඕනෑම අවස්ථාවක මේ පනතේ දෙවැනි උප ලේඛනයේ I වැනි තීරුවෙහි, නියමිත කුමන හෝ කාර්යයකින් රජයට ලැබෙන ලැබීම් එවැනි කාර්යන් සඳහා රජයෙන් කැරෙන වියදම් පියවීමට ප්‍රමාණවත් නොවන්නේ නම්, එවැනි වියදම් පියවීමට මුදල් ඇමති විසින් අවශ්‍ය යැයි හඟින ප්‍රමාණයන් විටින් විට ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජයට සුදුස්සක් කළ හැකි වෙනත් අනෙක් අරමුදලකින් හෝ, මුදල් වලින්, අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි මුදල් ඇමති විසින් නියෝගයකින් විධාන කළ හැකිය. එහෙත්, එසේ අත්තිකාරම් වශයෙන් දෙන මුළු ප්‍රමාණය එම උප ලේඛනයෙහි II වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම වැය ප්‍රමාණය නො ඉක්මවිය යුතුය. එවැනි කාර්යයක් සඳහා අත්තිකාරම් වශයෙන් දෙන යම් මුදලක්, මුදල් ඇමති විසින් නියෝගයකින් විධාන කරන පිළිවෙළට ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවිය යුතුය.

(5) මේ පනතේ පළමුවැනි උප ලේඛනයේ විධිවිධානානුසාරයෙන්, අංක: 3, 5 සහ 7 යන වැය ශීර්ෂ වලට හැර එම උප ලේඛනයේ නියමිත අනෙක් ශීර්ෂයක් යටතේ දක්වෙන වෙනත් වැය ශීර්ෂයකට, වෙන් කැරුනු යම් මුදලක් වැය කොට නොමැති නම් හා වැය කැරෙන ලෙසක් නොපෙනෙන්නේ නම්, භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය පවරා ඇති වෙනත් නිලධාරියකු ගේ හෝ නියෝගය අනුව, එම ශීර්ෂය යටතේ වූ වෙනත් වැය ශීර්ෂයකට පැවරිය හැකිය.

(6) මේ පනතෙහි දෙවැනි උප ලේඛනයේ II වැනි, III වැනි, IV වැනි හෝ V වැනි තීරුවල නියමිත උපරිම සීමාවන් රජයේ අනුමැතිය ඇතිව, මුදල් ඇමති විසින් නියෝග කිරීමෙන් වෙනස් කළ හැකිය. එවැනි කුමන හෝ නියෝගයක් එසේ ප්‍රකාශ කර ඇත්නම්, එහි නියම කළ හැකි එකී නියෝගය පැනවීමේ දිනට, පෙර දිනක සිට එකී නියෝගය ක්‍රියාත්මක වී ඇති බැව් සැලකිය යුතුය.

(7) මේ පනතෙහි දෙවැනි උප ලේඛනයේ, උචිත තීරුවලට යම් කටයුත්තක් සහ එවැනි කටයුත්තකට සම්බන්ධ සියලුම හෝ කුමන හෝ උපරිම ප්‍රමාණයන් එකතු කොට, පාර්ලිමේන්තු යෝජනා සම්මුතියකින් සංශෝධනය කළ හැකිය.

**උප ලේඛන පිළිබඳ සටහන**

මේ පනතේ පළමු වැනි උපලේඛනයේ, 1964 ඔක්තෝබර් 1 වැනි දසින් පටන් ගෙන, 1965 සැප්තැම්බර් 30 වැනිදසින් අවසන් වන මුදල් වර්ෂයේ පොදු සේවාවන් සඳහා ගෙවිය හැකි ප්‍රමාණයන් කොටස් කොට දක්වා ඇත. ඒ ඒ පොදු සේවා ශීර්ෂ යටතේ ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණය රුපියල් දෙසිය විසි කෝටි හැත්තෑ හතර ලක්‍ෂ තිස් හතර දහස් අටසිය පනස් හයක් වෙයි.

මේ පනතේ දෙවැනි උප ලේඛනයෙන්, රජයේ කටයුතු ඒ ඒ දෙපාර්තමේන්තු යටතේ බෙදූ ඒ ඒ ශීර්ෂ යටතේ ලැබිය හැකි උපරිම වියදම් සීමාව, රජයේ කට-යුතු ගිණුම් වලට බැර වශයෙන් ලැබිය හැකි උපරිම සීමාව, රජයේ කටයුතු සඳහා හර වශයෙන් ලැබිය හැකි උපරිම සීමාව, සහ රජයේ කටයුතු සඳහා ලැබිය හැකි වගකීම් වල උපරිම සීමාව, දක්වා ඇත.

**(ii) 1964 අංක 33 දරන බැංකු හර බදු (සංශෝධන) පනත.**

**1957 අංක 42 දරන බැංකු හර බදු පනත සංශෝධන කිරීම සඳහා පනතකි.**

1. මේ පනත 1964 අංක 33 දරන බැංකු හර බදු සංශෝධන පනත යනුවෙන් හැඳින්වෙයි.

2. 1959 අංක 1 දරන පනතින් සංශෝධනය කරන ලද, 1957 අංක 42 දරන බැංකු හර බදු පනතේ 15 වැනි වගන්තිය මෙයින් මෙසේ සංශෝධනය කරනු ලැබේ.

(1) "සහතික පතට අදාල" යන වචන වලට පහත දක්වෙන්න ආදේශ කිරීමෙන්:-

සහතික පතට අදාල :

පිට පළාත්වල පිහිටි ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ සෑම ශාඛාවක් සම්බන්ධයෙන් එවැනි ශාඛාවක කළමනාකරු විසින් එවැනි සහතිකයක් ලිවිය යුතු අතර එවැනි සහතිකයක් අදාල ලිත් මාස තුන අවසන් වී දින තිහක් ඉකුත්වීමට පෙරාතුව එකී කළමනාකරු විසින් එවැනි සහතිකයක් එහි පිටපතක් සමග මෙහි සඳහන් අධිපති වෙත එවිය යුතුය.

මෙම වගන්තියේ "පිට පළාතක පිහිටි ශාඛාව" යනුවෙන් අදහස් කරනුයේ "කොළඹ නගර සභාවේ පරිපාලනයට යටත් ප්‍රදේශයෙන් බාහිරව ලංකාවේ පිහිටි ශාඛාවක්" වෙයි; සහ

(2) එම වගන්තියෙහි තීරු සටහන වෙනුවට පහත දක්වෙන තීරු සටහන ආදේශ කිරීමෙන්:-

සෑම මාස තුනකටම වරක් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත යැවිය යුතු මුළු හර ප්‍රමාණය යනාදිය අදාල සහතිකය.

# ආ. 1964 දී මුදල් මණ්ඩලය විසින් සකස් කැරුනා ප්‍රධාන පාලන විධිවිධාන

සම්බන්ධ අංකය: බීසී/බී 9/25/52.
(i) චක්‍රලේඛ අංකः 18
වෙළෙඳ බැංකු වෙත.

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590.
කොළඹ 1,
1964 ජනවාරි 15

**<u>මහ බැංකුවේ විනිමය අනුපාතිකයන්</u>**

මුදල් නීති පනතේ 422 වැනි පරිච්ඡේදයේ 74 වැනි වගන්තිය සම්බන්ධවයි.

මහ බැංකුව, 1964 ජනවාරි 15 වැනි දින සිට, අපනයන බිල්පත් වල වට්ටම් වශයෙන් ලැබෙන රන් පවුම් අය වෙළෙඳ බැංකු වලින් එතැන් මිලට ගනු ලබන්නේ ලංකා රුපියලට සිලිම් 1 පැන්ස 6 3/64 ක් වූ මහ බැංකුවේ ගැනුම් අනුපාතිකය අනුවය. තවද, මෙම විධිවිධාන යටතේ මහ බැංකුව විසින් මිලදී ගන්නා ලද රන් පවුම් පරිමාව නොයික්මවන ප්‍රමාණයකට, එසේ වට්ටම් කරන ලද බිල්පත් කල් පිරෙන දිනයට පෙරාතුව වූ, දින 7 නොඉක්මවන දිනයක බාරදීම සඳහා එදිනම එම අනුපාතිකයට ම, රන් පවුම් ඉදිරි මිලට විකුණනු ලැබේ. මෙම චක්‍රලේඛය යටතේ වූ විශේෂ අනුපාතිකය ලබා ගැනීමට නම්, ඉදිරි මිලට ගැනුම් සඳහා එවනු ලබන අයැදුම් පත මෙම චක්‍රලේඛයේ වගන්තිවලට අනුකූල බවට සහතිකයක් ද එවිය යුතුය.

ඕනෑ ම අවසථාවක මෙම චක්‍රලේඛයේ දක්වෙන විධිවිධාන ඉවත් කිරීමට හෝ එයට තවත් විධිවිධාන එක් කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ ඉඩ ඇත.

බී. සී. ගුණසේකර
නියෝජ්‍ය අධිපති

එස්. බී. අමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරී

**(ii) චක්‍රලේඛ අංක: 19**

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590.
කොළඹ 1,
1964 අගෝස්තු 24 වැනි දින.

**මුදල් ප්‍රති දීමනා - මධ්‍ය හා දීර්ඝ කාලීන ණය සඳහා පොලී අනුපාතිකය.**

මුදල් නීති පනතේ 88 අ (1) (ඇ) වගන්තිය (1963 අංක 11 දරන මුදල් පනතේ 67 වැනි වගන්තිය ප්‍රකාර) සම්බන්ධවයි.

කර්මාන්ත, කෘෂිකර්මාන්තය, වෙළෙඳාම, වාණිජ හෝ ව්‍යාපාරික කටයුතු නගාලීම හෝ සංවර්ධනය සඳහා ණය දෙන ආයතනය විසින් දෙන ලද ණය දීමනා සඳහා මහ බැංකුවෙන් දෙනු ලබන මුදල් ප්‍රති දීමනා සඳහා පොලී අනුපාතිකය වර්ෂයකට 5% කි.

**එස්. ඩී. අමරසිංහ**
ප්‍රධාන ගණකාධිකාරී

**ඩී. ඩබ්ලිව්. රාජපත්‍ිරාන**
අධිපති

**(iii) එක්සත් ජනපද ඩොලර් සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතිකයන්**

| දිනය | චක්‍රලේඛ අංකය | | මිලට ගැනීම (ඩොලර් 100 කට) | විකිණීම (ඩොලර් 100 කට) |
|---|---|---|---|---|
| 64. 6. 22 | 1/196 | එතැන් | රු. 476. 25 | රු. 476. 50 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 476. 25 | මසකට සත -/25 කට අධි මිලක් එතැන් මිලට එකතුව |
| 64. 7. 20 | 1/197 | එතැන් | රු. 477. 00 | රු. 477. 25 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 477. 00 | මසකට සත -/25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |